දුරකථන/தொலைபேசி இல./Telephone Nos

අමාත්‍යතුමා / அமைச்சர் / Minister } 2784832

ලේකම් / செயலாளர் / Secretary } 2784811

කාර්යාලය / அலுவலகம் / Office } 2785141-50 Fax: 2784846

ඊමේල්/ஈ–மெயில்/E-mail : isurupaya@moe.gov.lk

ඔබේ අංකය / உமது இல. / Your No. } ..............................

අධ්‍යාපන අමාත්‍යාංශය

கல்வி அமைச்சு

Ministry of Education

'ඉසුරුපාය', ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ
බත්තරමුල්ල
'இசுருபாய' ஸ்ரீ ஜயவர்தனபுர கோட்டை
பத்தரமுல்ல
"Isurupaya", Sri Jayawardhanapura Kotte
Battaramulla.

මගේ අංකය / எனது இல. / My No. } ඊඩී/15/02/53/03/III වෙළම

දිනය / திகதி / Date } 2017.11. 23

චක්‍රලේඛ අංක: **43/2017**

සියලුම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්,
සියලුම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
උසස් පෙළ වෘත්තීය විෂය ධාරාව ක්‍රියාත්මක කෙරෙන නියාමක ව්‍යාපෘතියේ පළමු අදියරේ පාසල්වල විදුහල්පතිවරුන් වෙත,

<u>දහතුන් වසරක සහතික කළ අධ්‍යාපන වැඩසටහන යටතේ උසස් පෙළ වෘත්තීය විෂය ධාරාව ක්‍රියාත්මක කෙරෙන පාසල් සඳහා ලබා දෙනු ලබන පාසල් පාදක මූල්‍ය ප්‍රදාන ඵලදායි අයුරින් භාවිතයට ගැනීම</u>

1. හැඳින්වීම

13 වසරක සහතික කරන ලද අධ්‍යාපන වැඩසටහන ක්‍රියාත්මක කෙරෙන පාසල් සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පාසල් පාදක මූල්‍ය ප්‍රදානයන් කාර්තුමය වශයෙන් ලබා දීමට තීරණය කර ඇත.

මේ යටතේ නියාමක ව්‍යාපෘතියේ, එක් පාසලකට අවමය රු.500,000.00 ක් වන පරිදි, පළමු මූල්‍ය ප්‍රදානය අවසාන ගෙවීමක් (Outright Grant) වශයෙන් ලබා දෙනු ඇත. මෙම මූල්‍ය ප්‍රදානය පාසලේ පාසල් සංවර්ධන සමිති ගිණුමට බැර කරනු ඇත. මෙම මූල්‍ය ප්‍රදානය අදාළ චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල වන පරිදි 2017.11.01 දින සිට 2018.03.31 දින දක්වා උපරිම කාර්යක්ෂමතාවයෙන් හා ඵලදායිතාවයෙන් යුතුව පාසලේ උසස් පෙළ වෘත්තීය විෂය ධාරාව ක්‍රියාත්මක කිරීම සඳහා පමණක් යොදවා ගැනීම ඒ ඒ පාසලේ විදුහල්පතිගේ වගකීම වේ.

මෙම ප්‍රදානයට අදාළ සියලු අධීක්ෂණ හා නියාමන කටයුතු අධ්‍යාපන අමාත්‍යාංශයේ, පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවල, කලාප අධ්‍යාපන කාර්යාලවල හා කොට්ඨාස අධ්‍යාපන කාර්යාලවල නිලධාරීන් විසින් අඛණ්ඩව සිදු කළ යුතුය

2. මූල්‍ය ප්‍රදානය ලබා දීමේ අරමුණ

උසස් පෙළ වෘත්තීය විෂය ධාරාව සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන ක්‍රියාකාරකම් පාසල් මට්ටමින් ඉටුකරලීමට අවැසි තීරණ ගත හැකි වන පරිදි පාසල බලාත්මක කරලීම මෙහි මූලික අරමුණයි. එමෙන්ම මෙම විෂය ධාරාවට අදාළව විෂයයන්, විෂය බාහිර ක්‍රියාකාරකම් හා විෂය සමගාමී ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම හා සංවර්ධනය, ප්‍රායෝගික පුහුණුව සඳහා භෞතික හා මානව සම්පත් ඵලදායිව, කාර්යක්ෂමව හා නිර්මාණශීලී ලෙස භාවිතයට ගැනීමට පාසලට සහාය වීම ද මෙම ප්‍රදානයේ අරමුණකි.

3. පාසල් පාදක මුල්‍ය ප්‍රදාන ඵලදායි ලෙස ආයෝජනය කිරීම

මෙම මුල්‍ය ප්‍රදාන වියදම් කිරීමේදී අධ්‍යාපන අමාත්‍යාංශ චක්‍රලේඛ අංක 07/2013 දරණ පාසල් පාදක ගුණාත්මක, ප්‍රමාණාත්මක හා ව්‍යුහාත්මක සංවර්ධනය සඳහා සැලසුම්කරණය හා ප්‍රසම්පාදනය පිළිබඳ චක්‍රලේඛය සහ මාර්ගෝපදේශ අත්පොතෙහි දැක්වෙන උපදෙස් සුදුසු පරිදි යොදාගත යුතුය.

වෘත්තීය විෂය ධාරාවට අදාළ වන මෙහි පහත දක්වා ඇති කාර්යයන් සඳහා මෙම පාසල් පාදක මුල්‍ය ප්‍රදාන යොදා ගැනීමට අදාළ පාසල්වල විදුහල්පතිවරුන්ට මෙයින් බලය පවරනු ලැබේ.

(අ) වෘත්තීය විෂය ධාරාවට අදාළ සියලු ක්‍රියාකාරකම්, ප්‍රායෝගික පුහුණුවීම්, පාසල් වේලාවෙන් පසුව සිදුකෙරෙන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

(ආ) සහාය ඉගෙනුම් ද්‍රව්‍ය, ප්‍රායෝගික පුහුණුව සඳහා අවශ්‍ය උපකරණ, ද්‍රව්‍ය මිලදී ගැනීම හා නඩත්තුව, ප්‍රායෝගික පුහුණුව සඳහා ස්ථාන පහසුකම් සලසා ගැනීම

(ඇ) වෙනත් අදාළ ආයතනයන්හි ප්‍රායෝගික පුහුණු අවස්ථා, උපදේශන හා සම්පත් පුද්ගල සේවා ලබාගැනීම

(ඈ) පාසල් පාදක ධාරිතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

(ඉ) විෂය ධාරාවට අදාළ විෂය සමගාමී, විෂය බාහිර ක්‍රියාකාරකම් හා ක්ෂේත්‍ර අධ්‍යාපන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

(ඊ) නියාමක ව්‍යාපෘතිය ක්‍රියාත්මකවන කාලසීමාව තුළ පරිගණක හා අනෙක් උපකරණ නඩත්තුව, විදුලි බිල්පත් හා අන්තර්ජාල බිල්පත් ගෙවීම

4. පාසල් පාදක මුල්‍ය ප්‍රදාන යොදාගත නොහැකි අයිතම

වෘත්තීය විෂය ධාරාවට අදාළ නොවන පහත සඳහන් අයිතම සඳහා පාසල් පාදක මුල්‍ය ප්‍රදාන භාවිත කළ නොහැකිය.

(i) දුරකථන බිල්පත් ගෙවීම
(ii) ජල බිල්පත් ගෙවීම
(iii) ආරක්ෂක සේවා සඳහා ගෙවීම්
(iv) නව ගොඩනැගිලි ඉදිකිරීම්
(v) රථ වාහන මිලදී ගැනීම, නඩත්තුව හා අලුත්වැඩියාව
(vi) සෘජු වැටුප් හා වේතන ගෙවීම්
(vii) සමරු තිළිණ/සමරු ඵලක/උපහාර තිළිණ, ආරාධනා පත් මුද්‍රණය, උත්සව සඳහා සංග්‍රහ වියදම්

5. පාසල් මට්ටමේ සැලසුම් සකස් කිරීම හා අනුමත කිරීම

වෘත්තීය විෂය ධාරාව හදාරනු ලබන ශිෂ්‍ය සංඛ්‍යාව හා තෝරා ගනු ලබන වෘත්තීය විෂයයන් අනුව මෙම චක්‍රලේඛය සමඟ අමුණා එවා ඇති ආකෘති අංක 01 ට අනුව පාසලේ විදුහල්පති විසින් සකස් කරන ලද සැලැස්ම, පිටපත් 4 කින් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබා ගත යුතුය. කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් එසේ අනුමත කරන ලද එක් පිටපතක් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ වෙතද, අනෙක් පිටපත අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් වෙතද ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. (පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ 13 වසරක සහතික කළ අධ්‍යාපන වැඩසටහනේ සම්බන්ධීකරණ නිලධාරී සහ කලාප අධ්‍යාපන කාර්යාලයේ නි.අ.අ./ස.අ.අ. සැලසුම් විසින් මෙම කාර්යය සම්බන්ධීකරණය කළ

යුතුය. තවද අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් වෙත ඉදිරිපත් කෙරෙන පිටපත අධ්‍යාපන අධ්‍යක්ෂ සැමට අධ්‍යාපන ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය, ඉසුරුපාය, බත්තරමුල්ල යන ලිපිනයට ලැබීමට සැලැස්විය යුතුය)

6. පාසල් ප්‍රසම්පාදන ක්‍රියාවලිය

ඉහත 3 ඡේදයේ සඳහන් 07/2013 චක්‍රලේඛයේ 11 හි සඳහන් පාසල් ප්‍රසම්පාදන ක්‍රියාවලියේ මූල්‍ය සීමාවන්, 12 ඡේදයේ සඳහන් පාසල් ප්‍රසම්පාදන ක්‍රියාවලිය හා 13හි සඳහන් භාර ගැනීම හා පොත්වල සටහන් කිරීම, උපදෙස්වලට අනුව ප්‍රසම්පාදන ක්‍රියාවලිය හා තාක්ෂණික ඇගයීම් කමිටු කාර්යයන් ඉටු කළ යුතුය.

7. ගිණුම්ගත කිරීම

වැය ලෙජරය නඩත්තු කිරීම සහ ඉහත 3 ඡේදයේ සඳහන් 07/2013 චක්‍රලේඛයේ අංක 14 හි සඳහන් ගෙවීම් හා ගිණුම්ගත කිරීම් පිළිබඳව සකස් කරනු ලබන සිව්මස් ගිණුම් වාර්තාවට මෙම මූල්‍ය ප්‍රදාන යටතේ කරන ලද වියදම්ද ඇතුළත් කර එම වාර්තා කලාප හා පළාත් අධ්‍යාපන බලධාරීන් වෙත නිසි පරිදි යැවිය යුතුය.

අධ්‍යාපන අමාත්‍යාංශයේ, පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවල, කලාප අධ්‍යාපන කාර්යාලවල නිලධාරීන් විසින් මෙම මූල්‍ය ප්‍රදානය කළමනාකරණය කිරීම පිළිබඳව කලින් කලට විදුහල්පතිවරුන් හා වෘත්තීය විෂය ධාරාව භාර අංශ ප්‍රධාන ගුරුභවතුන්ව නිසි ලෙස දැනුවත් කරමින් ප්‍රතිපෝෂණය ලබා දීමට ක්‍රියා කළ යුතුය.

8. පාසල් පාදක මූල්‍ය ප්‍රදානය පිළිබඳ ඉදිරිපත් කළ යුතු මූල්‍ය ප්‍රගතිය සහ නියාමන වාර්තා

පාසලේ විදුහල්පති විසින් මෙම චක්‍රලේඛය සමඟ අමුණා එවා ඇති ආකෘති අංක 02 ට අනුව මෙම මූල්‍ය ප්‍රදානයට අදාළ මූල්‍ය හා භෞතික ප්‍රගති වාර්තාව සහ ආකෘති අංක 3 ට අනුව සකස් කළ මාසික ගිණුම් සාරාංශය කලාප අධ්‍යාපන අධ්‍යක්ෂට හා පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ 13 වසරක සහතික කළ අධ්‍යාපන වැඩසටහනේ සම්බන්ධීකරණ නිලධාරියාට ද පිටපතක් සහිතව අධ්‍යාපන අමාත්‍යාංශයේ සැමට අධ්‍යාපන ශාඛාවේ අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත සෑම මාසයක්ම අවසානයේදී එළඹෙන ඊළඟ මාසයේ 10 වෙනි දිනට පෙර එවිය යුතුය. තවද පාසල් ප්‍රදානයෙන් මුදල් වියදම් කළ වහාම ඒ පිළිබඳ තොරතුරු මෙම වෘත්තීය විෂය ධාරාවට අදාළ දත්ත පාදකයට ඇතුළත් කළ යුතුය.

9. නියාමනය

මෙම මූල්‍ය සම්පත් ඵලදායි හා කාර්යක්ෂම අයුරින් පාසල තුළ ආයෝජනය කිරීම හා එමගින් අපේක්ෂිත උසස් ප්‍රතිඵල ලබා ගැනීමට ඉහත 3 ඡේදයේ සඳහන් අංක 07/2013 දරණ චක්‍රලේඛයේ 15 ඡේදයේ සඳහන් නියාමන ක්‍රියාමාර්ගවලට අමතරව පහත සඳහන් පරිදි වැඩිමනත් නියාමන කටයුතු සිදුකිරීම කෙරෙහි ද ඔබගේ අවධානය යොමු විය යුතුය.

i. පාසල් මට්ටම - අභ්‍යන්තර නියාමනය විදුහල්පති විසින් (පාසල් සැලසුම් / කළමනාකරණ කමිටුව මගින්)
ii. කොට්ඨාස මට්ටම - කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් එම පාසල් අධීක්ෂණය කිරීමේදී
iii. කලාප මට්ටම - කලාප අධ්‍යාපන කාර්යාලවල සැලසුම්, සංවර්ධන හා විෂයභාර අධ්‍යක්ෂ වරුන්, 13 වසරක අධ්‍යාපන වැඩසටහනේ සම්බන්ධීකරණ නිලධාරීන් හා ගිණුම්කරණ අංශ නිලධාරීන් විසින්

iv. පළාත් මට්ටම - පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවල සැලසුම්, සංවර්ධන හා විෂයභාර අධ්‍යක්ෂවරුන්, 13 වසරක අධ්‍යාපන වැඩ සටහනේ සම්බන්ධීකරණ නිලධාරීන් හා ගිණුම්කරණ අංශ නිලධාරීන් විසින්

v. රේඛීය අමාත්‍යාංශය - 13 වසරක සහතික කරන ලද අධ්‍යාපන වැඩසටහනට සම්බන්ධ නිලධාරීන්, අධ්‍යාපන අමාත්‍යාංශයේ නිලධාරීන් සහ අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රමිති හා කළමනාකරණ ඒකකය, ජාතික පාසල් අංශය, හා පාසල් ගොඩනැගිලි අධ්‍යක්ෂ සහ එම අංශයේ නිලධාරීන් හා ගිණුම්කරණ අංශ නිලධාරීන්

10. මූල්‍ය ප්‍රදානය විගණනය

අධ්‍යාපන අමාත්‍යාංශය සහ පළාත් මට්ටමේ විගණන නිලධාරීන් විසින් මෙම මූල්‍ය ප්‍රදානය යෙදවීම පිළිබඳව කලින් කලට සොයා බලමින්, පාසල් බලාත්මක කිරීම සඳහා වූ මෙම ප්‍රයත්නයෙහි සාර්ථකත්වයට අනුබල දිය යුතුය.

මෙම විශේෂිත මූල්‍ය ප්‍රදාන පහසුකම්, නිසි කාල සීමාව තුළදී ප්‍රශස්ත අයුරින් භාවිතා කිරීමට අපොහොසත් වුවහොත් ඒ පිළිබඳ පාසල් ප්‍රධානීන්ගෙන් කරුණු විමසිය හැකිය.

11. විශේෂ අවස්ථා

මෙම චක්‍රලේඛයේ විශේෂයෙන් උපදෙස් සඳහන්ව නොමැති අවස්ථාවන් පිළිබඳව ක්‍රියා කිරීමේදී දැනට ක්‍රියාත්මක මූල්‍ය හා පරිපාලන රෙගුලාසි යොදා ගතයුතු වන බවද වැඩිමනත් වශයෙන් සඳහන් කරමි.
මෙම චක්‍රලේඛය පිළිබඳ වැඩිදුර පැහැදිලි කර ගැනීම අවශ්‍ය වුවහොත් අධ්‍යාපන අමාත්‍යාංශයේ සැමට අධ්‍යාපන ශාඛාවේ 0112787136 හෝ ගිණුම් අංශයේ දුරකථන අංක 0112786609 ඇමතීමට කටයුතු කළ මැනවි.

13 වසරක අධ්‍යාපන වැඩසටහනේ පළාත් සම්බන්ධීකරණ නිලධාරී විසින් මෙම මූල්‍ය ප්‍රදාන යොදා ගැනීම, අවශ්‍ය සම්බන්ධීකරණය, අධීක්ෂණය සහ නියාමනය පිළිබඳව සිය විශේෂ අවධානය යොමුකරලීම අත්‍යවශ්‍ය බව දන්වමි.

සුනිල් හෙට්ටිආරච්චි
අධ්‍යාපන ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය

පිටපත්:
1. විගණකාධිපති
2. ලේකම්, මුදල් කොමිසම
3. පළාත් ප්‍රධාන ලේකම්වරුන්
4. සියලුම අතිරේක ලේකම්වරු
5. අධ්‍යක්ෂ ජනරාල්,ගිණුම් හා මූල්‍ය, අධ්‍යාපන අමාත්‍යාංශය
6. ප්‍රධාන මූල්‍ය නිලධාරී, අධ්‍යාපන අමාත්‍යාංශය
7. අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අධ්‍යාපන ආයතනය
8. අධ්‍යාපන අමාත්‍යාංශයේ සියළුම අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
9. ප්‍රධාන ගණකාධිකාරී, අධ්‍යාපන අමාත්‍යාංශය
10. 13 වසරක අධ්‍යාපන වැඩසටහනේ පළාත් සම්බන්ධීකරණ නිලධාරීන්
11. පාසල් ගොඩනැගිලි අධ්‍යක්ෂ, අධ්‍යාපන අමාත්‍යාංශය
12. පළාත් ප්‍රධාන ගණකාධිකාරී
13. පළාත් ප්‍රධාන ඉංජිනේරු

ඇමුණුම 1

## 13 වසරක සහතික කරන ලද අධ්‍යාපන වැඩසටහන - අධ්‍යාපන අමාත්‍යාංශය
## නියාමක ව්‍යාපෘතියේ පළමු අදියරේ පාසල්වලට පාසල් පාදක ප්‍රදානයන් (School Based Grant) ලබාදීම

පාසලේ නම: ..................................................

කලාපය : ..................................................

පළාත : ..................................................

| අනු අංකය | ක්‍රියාකාරකම් | අරමුණු |
|---|---|---|
| 1 | | 1.1.........................<br>1.2.........................<br>1.3......................... |
| 2 | | 2.1.........................<br>2.2.........................<br>2.3......................... |

| අනු අංකය | අයත්වන ක්ෂේත්‍ර අංකය | ක්‍රියාකාරකම් | කාල රාමුව | ඇස්තමේන්තු මුදල් රුපියල් | අපේක්ෂිත නිමැවුම (Output) | අපේක්ෂිත ප්‍රතිපල (Outcomes) | ක්‍රියාත්මක කිරීමේ වගකීම | වෙනත් සටහන් |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |

පාසල් සංවර්ධන සමිති ගිණුම් අංකය:- .................................... බැංකුව: .................................... ශාඛාව : ....................................

ඉහත සඳහන් විස්තර හා තොරතුරු සත්‍ය බවට සහතික කරමි.

අත්සන :..................................................

විදුහල්පතිගේ නම :..................................................

දිනය : ..................................................

නිල මුද්‍රාව

අනුමත කරමි.

කලාප අධ්‍යාපන අධ්‍යක්ෂගේ අත්සන ..............................

නිල මුද්‍රාව

ඇමුණුම 2

## 13 වසරක සහතික කරන ලද අධ්‍යාපන වැඩසටහන - අධ්‍යාපන අමාත්‍යාංශය
## පාසල් පාදක ප්‍රදානය සම්බන්ධ නියාමන ආකෘති පත්‍රය

පාසලේ නම: ..................................................
කලාපය : ..................................................
පළාත : ..................................................

| පා.පා.මු.ප්‍ර. යටතේ ලද මුදල රු. | ප්‍රදානය ලද දිනය | ඉටුකරන ලද ක්‍රියාකාරකම් | වැය ඇස්තමේන්තුව රුපියල් | .................. දිනට භෞතික ප්‍රගතිය | .................. දිනට මූල්‍ය ප්‍රගතිය | වෙනත් සටහන් |
|---|---|---|---|---|---|---|
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |

ඉහත සඳහන් විස්තර හා තොරතුරු සත්‍ය බවට සහතික කරමි.

අත්සන :..................................................
විදුහල්පතිගේ නම :..................................................
දිනය : ..................................................
නිල මුද්‍රාව

පිටපත්: පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ, පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
පළාත් සම්බන්ධීකාරක, 13 වසරක සහතික කළ අධ්‍යාපන වැඩසටහන
කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ, කලාප අධ්‍යාපන කාර්යාලය

ඇමුණුම 3

පළාත:........................ කලාපය: ..................................

පාසල :..................................................................................

## 13 වසරක සහතික කරන ලද අධ්‍යාපන වැඩසටහන - අධ්‍යාපන අමාත්‍යාංශය

පාසල් පාදක මූල්‍ය ප්‍රදානයේ ........................................................ මස ගිණුම් සාරාංශය

| පාසල් පාදක මූල්‍ය ප්‍රදාන ලද දිනය | පාසල් පාදක මූල්‍ය ප්‍රදාන ලද මුදල | ....................මස ආරම්භක සමුච්චිත වියදම | .................... ට මාසික වියදම | ....................මස අගට සමුච්චිත මුළු වියදම | ඉතිරි මුදල | වෙනත්විස්තර ඇතොත් සඳහන් කරන්න. |
|---|---|---|---|---|---|---|
| | | | | | | |

ඉහත සඳහන් විස්තර හා තොරතුරු සත්‍ය බවට සහතික කරමි.

අත්සන :.............................................
විදුහල්පතිගේ නම :.............................................
දිනය : .............................................
නිල මුද්‍රාව

පිටපත්: පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ, පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
පළාත් සම්බන්ධීකාරක, 13 වසරක සහතික කළ අධ්‍යාපන වැඩසටහන
කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ, කලාප අධ්‍යාපන කාර්යාලය